


# අපේ ජනතාව කොටින්ට ශාප කරනු අපේම ඇස්වලින් දුටුවෙමු

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න

ප්‍රහාරක බළඇණිවල සෙන්පතිවරු, අණදෙන සෙන්පතිවරු, අංශ භාරකරු යන අයගේ මට්ටමෙහි සිට සාමාන්‍ය සටන්කාමියා දක්වා සංවිධානයේ නායකත්වය කියන දෙයම කළ යුතුය යන්න හමුදාමය විනයට යටත් අය ලෙසින් අප තුළ වර්ධනය කෙරිණි. සාමාන්‍යයෙන් අප දැන සිටි පරිදි සංවිධානයේ වැඩිහිටි ප්‍රමුඛ සාමාජිකයන් වන ඇන්ටන් බාලසිංහම්, ඊරෝස් සංවිධානයෙහි හිටපු නායක බාලකුමාර්, මූල්‍ය අංශය භාරව සිටි තමිළේන්දි යන අයත්, ජ්‍යෙෂ්ඨ සෙන්පති යන මට්ටමෙහි බුද්ධි අංශය භාර පොට්ටු අම්මාන් ද උන්හ. ඔවුන් අතරින් පවා තම අදහස නායකතුමා වෙත යම්තාක් දුරට හෝ නොබියව පැවසීමට හැකි පුද්ගලයා වූයේ ඇන්ටන් බාලසිංහම් පමණි.

අවසානයට සිදු කෙරුණු සාම සාකච්ඡාවලදී බලය විමධ්‍යගත කළ දේශපාලන විසඳුමක් කෙසේ හෝ ලබාදිය යුතුය යන උනන්දුවෙන් ඇන්ටන් බාලසිංහම් 'අභ්‍යන්තර ස්වයං නීර්ණ අයිතිය සහිත සන්ධීය ක්‍රමය' යන විසඳුම පිළිබඳව සලකා බැලීමට සූදානමින් සිටින බවට අදහසක් ඉදිරිපත් කළේය. එහෙත් එම කරුණ නායක ප්‍රභාකරන්තුමාට ඒ තරම් හිතට ඇල්ලුවේ නැති බවක් පෙනෙන්නට තිබුණි. දේශපාලන විසඳුමක් බලහත්කාරයෙන් පැටවීම මගින් කොටින්ගේ ආයුධ ඔවුන්ගෙන් ගලවා ගැනීමට ජාත්‍යන්තර බලවේග උත්සාහ කරන බවට ඔහු චෝදනා කළේය. ඔවුන් එළු දැළට ඇන්ටන් බාලසිංහම් හසුවී ඇති බවක් ඔහු අදහස් කළේය. තම මරණය හැර වෙනත් කිසිම අවස්ථාවක තම අතින් ආයුධ ඉවත් කර ගැනීමට නායකතුමා බිඳක් හෝ සූදානම් වී සිටියේ නැත. එහෙයින් දෙදෙනා අතර මත ගැටුම් ඇතිවී දෙදෙනා මුහුණට මුහුණ කතා කිරීමට අකමැතිව සිටි අවස්ථාවක බලවත් සිත් බිඳීමකින් යුතුව ඇන්ටන් බාලසිංහම් අවසාන වතාවට කිලිනොච්චිය හැර දමා ගියේය.

සාමාන්‍යයෙන් ඔහු හෙළිකොප්ටරයෙහි නැඟී පිටවී යන අවස්ථාවල තිබෙන සිනහව සහ සතුට අහිමිව ගොස් ඔහුගේ සහ ඔහුගේ බිරියගේ ඇස්වලින් කඳුළු උනනු බොහෝ දෙනෙකුගේ අවධානයට ලක්විය. විමුක්ති කොටි සංවිධානය බොහෝ අංශවලට බෙදී ජනතාව අතර තම පරිපාලන කටයුතු කරගෙන ගියත්, එම අංශ අතර සාමූහික වගකීමක් ඇති කළ නොහැකි තත්ත්වය අවසානය දක්වා පැවතුණි. තම අංශයේ කටයුතු හරියට කළොත් ඇති යන අදහසකින් සෑම අංශයකම භාරකරුවන් ක්‍රියාත්මක වූයේය. ජනතාව අතර ඇතිවූ ප්‍රශ්න ඒකාබද්ධ ක්‍රමයකින් විසඳීම උදෙසා මාසිකව සියලු ප්‍රධාන සෙන්පතිවරුන් සහ වගකීම් භාර නිලධාරීන් හමුවන රැස්වීමක් පවත්වා පරිපාලන ප්‍රශ්න ගැන එකට එක්ව කතාබහ කර විසඳාගන්නා මෙන් නායකතුමා කළ ඉල්ලීමෙන් යම්තාක් දුරකට ප්‍රශ්න සුහදව විසඳාගැනීමක් සිදු කෙරුණත් සම්පූර්ණ වෙනසක් ඇතිවූයේ නැත.

විමුක්ති කොටි සංවිධානයේ මූල්‍ය අංශය තම බදු එකතු කිරීමේ ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කළ ආකාරය ජනතාව තුළ තියුණු විවේචනයට හේතුවිය. දිගුකාලීන යුද්ධයෙන් ආර්ථික වශයෙන් ඉතාමත් දරුණු ලෙසින් පීඩාවට පත්ව සිටි ජනතාව කොටින් විසින් සූරාකනු ලබන බවට දැඩි විවේචන ජනතාව තුළින් මතුවිය. සංවිධානයේ මූල්‍ය අංශ භාරකරු තමිළේන්දි මේ චෝදනාවට කුමන පැහැදිලි කිරීම් කළත් ජනතාව එය මුළුමනින් පිළිගත්තේ නැත. තවද එහි සේවය කළ අය ජනතාව සමඟ කටයුතු කළ ආකාරයේ තිබූ අඩුපාඩු මෙම ප්‍රශ්නය තවත් දරුණු කළේය.

සාම කාලයේදී නිවාඩුව ගත කිරීමට මවුබිමට පැමිණි විදෙස්ගත දෙමළ ජනයාද මෙම ප්‍රශ්නය පිළිබඳ අඩුපාඩුව පෙන්වා දුන්හ. ඕමන්තෙහි විමුක්ති කොටින්ගේ පාලන ප්‍රදේශය ආරම්භ වන ස්ථානයෙහි 'වන්නි භූමිය ඔබව සාදරයෙන් පිළිගනියි' යනුවෙන් විශාල පුවරුවක සටහන් කර තිබුණි. එහෙත් සංවිධානයේ බදු අය කිරීම හේතුවෙන් එම දැන්වීම දෙස සරදම් ලෙසින් බලන්නට වූ ජනතාව සංවිධානයේ බදු අය කිරීමේ ක්‍රියාදාමය පිළිකුල් කළෝය. සංවිධානය ක්‍රියාත්මක කළ අනිවාර්ය බඳවා ගැනීමේ ක්‍රියා මාර්ගයද සංවිධානය හා ජනයා අතර අධික ලෙසින් ගැටුම් ඇති කළ ක්‍රියාමාර්ගයක් විය. රජයේ පාලනය යටතේ පැවැති ප්‍රදේශ දිගු කළක් සංවිධානයේ සෘජු සම්බන්ධතාවලින් බැහැරව පැවැති හෙයින් ආරම්භයේදී කොටින්ව දුටු වහාම බුරුතු පිටින් තරුණ තරුණියෝ අලුත් සටන්කාමීන් ලෙස සංවිධානය තුළ රොද බැඳගත්තෝය.

එහෙත් ටික දිනක් ගතවෙත්ම එම පිරිස් බලය අධික ලෙසින් හීන වන්නට විය. එහෙයින් සාම සාකච්ඡා පැවැති කාලයෙහි දී කාන්තා සහ පිරිමි සටන්කාමීන් සඳහා අලුතෙන් පුහුණු කඳවුරු රාශියක් ඇති කර මූලික ආයුධ පුහුණු කිරීම් දිගින් දිගටම සිදු කෙරිණි. ඒ සමඟම සීමා රක්ෂණ බළකාය, මහජන බළකාය ආදියද නැවතත් ආරම්භ කෙරුණි. සංවිධානය අතහැර ගිය සටන්කාමීන් නැවතත් සංවිධානයට ඇතුළත් කර ගැනීමේ සැළසුමද ක්‍රියාත්මක විය. මේ නිසා ජනතාව නැවතත් බොහෝ පීඩාවන්ට මුහුණ දුන්නෝය. සංවිධානයේ ප්‍රචාරක කටයුතු මාර්ගයෙන් සිදු කෙරුණු පිරිස් බලය එක්රැස් කිරීමේ ක්‍රියාමාර්ග අනිවාර්ය බඳවා ගැනීමේ ක්‍රියාමාර්ග ලෙසින් මඳින් මඳ වෙනස් වන්නට පටන් ගත්තේය.

'කොහොම හරි කවුරුන් හරි සංවිධානයේ සාමාජිකයෙක් ලෙසින් බඳවා ගන්න ලැබුණොත් ඇති' යන දරුණු ස්ථාවරය සංවිධානය ඇතුළේ ඇති වීමට පටන් ගෙන තිබුණි. සංවිධානයට අවශ්‍යව තිබුණේ ආයුධ ක්‍රියාත්මක කිරීමට පුහුණුව ලබාදුන් මිනිස් සිරුරක් පමණි යන මට්ටමට සංවිධානයේ ප්‍රතිපත්තිමය ස්ථාවරයන් සංකෝචනය වීමට පටන් ගෙන තිබුණි. දේශපාලන අංශයේ කාර්යභාරයන්ය යන මුවාවෙන් සංවිධානයේ සියලුම අංශයන් මෙම පිරිස් බඳවා ගැනීමේ වැඩසටහන තුළ මුළු වැර යොදා ක්‍රියාත්මක විය.

අවුරුදු තිහකටත් වඩා වැඩි ආයුධ සන්නද්ධ අරගල ඉතිහාසය තුළ දහස් ගණන් සටන්කාමීහු තම ජීවිත කැප කරමින් ද, ලක්ෂ ගණනක ජනතාව තම ප්‍රාණය සහ වස්තුව අහිමි කර ගනිමින් ද දැරිය නොහැකි බරක් දරාගෙන උන්නෝය. එහෙත් යුද පෙරමුණුවලදී කොටි ලබාගෙන සිටි ජයග්‍රහණයන් හේතුවෙන් ද, ජීවිත පරිත්‍යාග කර සිටි තම දරුවන් හේතුවෙන් ද කොටින්ගේ සියලු වර්ගයේ වැරදි සහ උල්ලංඝනයන් ඉවසා ගෙන සිටීමේ ශක්තියෙන් යුතුව ආයුධ සන්නද්ධ අරගලය විසින් ඇති කරන ලද සියලුම වේදනාවන් ද, පීඩාවන් ද ජනතාව දරාගෙන උන්නෝය. දෙමළ ජනතාවගේ එකම එක දේශපාලන ශක්තිය ලෙසින්, නැඟී සිටි විමුක්ති කොටින්ව සියලුම විවේචනයන්ට ඔබ්බෙන් දෙමළ ජනතාව තමන්ට විමුක්තිය උදාකර දෙන ගැලවුම්කරුවන් ලෙසින් විශ්වාස කළහ. නමුත් එම හැඟීම් සුනු විසුනු කරන ලෙසින් සාම කාලයට පසුව සංවිධානයෙහි වැඩ කටයුතු සකස් විය. එහෙයින් ජනතාව අතෘප්තියෙහි හිණි පෙත්තට පැමිණියහ. දිගු යුද්ධයෙහි බර දරාගත නොහැකි තත්ත්වයක් තුළ අපේ ජනතාව අත් ඔසවා කොටින්ට ශාප කරනු අපි ඇස්වලින් දැක්කෙමු.

දෙදහස් හතර වසරේ දෙසැම්බර් මාසයේ සුනාමි ආපදාව ඇතිවූ පසුව 'පශ්චාත් සුනාමි කළමනාකරණ ව්‍යුහය' ජාත්‍යන්තර ආධාර ලබාදෙන රටවල උපකාරයෙන් ක්‍රියාත්මක කළ ප්‍රතිව්‍යුහකරණ වැඩසටහනේ ලංකා රජය සමඟ එක්ව කොටින්ද කටයුතු කරන බවට වූ එකඟතාව ඇති කිරීමට සාකච්ඡා පැවැත්වීය. එහෙත් කොටින්ට මෙම සාකච්ඡාවට විශ්වාසයෙන් යුතුව සහභාගි වීමට හැකිවූයේ නැත. සැළසුම් ක්‍රියාත්මක කිරීම සඳහා නිත්‍යානුකූල බලයක් ලබා නොමැති තත්ත්වයක් තුළ දෙමළ ප්‍රදේශවල ප්‍රතිව්‍යුහකරණ කටයුතුවල යෙදීමට රජයට අනුමැතිය ලබාදීම කොටින්ට ගැටළු සහගත දෙයක් විය. පෙර සිදු නොවූ අයුරින් දෙමළ ජනයාගේ දේශපාලන ගැටළුව මටහිර මධ්‍යස්ථකරුවන් සමඟ හැසිරවීමේ තත්ත්වය ආරම්භ වී පැවැති හෙයින් එම දේශපාලන වාතාවරණය හැසිරවිය හැකි රාජ්‍ය තාන්ත්‍රික නිර්භීත බව කොටි නායකත්වයට අධික ලෙසින් අවශ්‍ය විය.

යුද පෙරමුණේ ලංකාවේ ආරක්ෂක අංශයේ නායකත්වයන් සහ ජාත්‍යන්තර හමුදා විශ්ලේෂකයන් ද විශ්මයට පත්වන අන්දමේ යුදමය උපක්‍රමයන් හසුරුවා බොහෝ ජයග්‍රහණයන් ලබා සිටි ප්‍රභාකරන් නායකතුමා සාමකාමී වාතාවරණය තුළ දේශපාලනික රාජ්‍ය තාන්ත්‍රික බවේ සූක්ෂමතාවන් නිර්භීතව ප්‍රයෝජනයට ගෙන දෙමළ ජනතාවට ස්ථිර දේශපාලන විසඳුමක් ලබාගත හැකි තත්ත්වය කරා ඉදිරියට යාමට නොහැකි අපහසුතාවයට පත්විය. ජීවන ආධාරක සියල්ලම අහිමිව යද්දී අරගලය පිළිබඳව විශ්වාසයෙන් සිටි ජනතාව වෙනුවෙන් එම හිතුවක්කාරකමෙන් මිදීමේ අවශ්‍යතාව ප්‍රභාකරන් නායකතුමාට ඇති වුවද, එම අවස්ථාවේ එය ඉටු කිරීමට එඩිතර බවක් ඔහු තුළ නොවීය. ඔහු කා වෙනුවෙන් සටන්කරන බව ප්‍රකාශ කළේ ද එම ජනතාව ආරක්ෂා කරන්නේ ද නැතහොත් කෝටි සංඛ්‍යාත මුදලක් වැය කර මහත් වෑයමකින් ගෙනැවිත් ගබඩා කර තිබූ ආයුධ බලය ආරක්ෂා කරන්නේ ද යන ප්‍රශ්නය ඔහු ඉදිරියේ මස් ලේ සහිතව නැඟී සිටියේය.

**සිසිර දිසානායක මහතා ලියන "ගී සඳලුව" ලිපිය, චූටි මල්ලී ලියන "දහ අට වන්ගුව" ලිපිය, විශ්වජිත් සන්දේශ් සූරියබණ්ඩාර මහතා ලියන "සිහිනයක් වගේ" නව කතාව, යන ලිපි නොවැලැක්විය හැකි හේතුවක් නිසා මෙවර පළ නොවන බව කරුණාවෙන් සලකන්න.**